## 2.8 ඉතිහාසකරණයේ නව ප්‍රවණතා: සමාජ පරිවර්තන අධ්‍යයනයෙහි ලා කාන්තා අධ්‍යයනය

ඩිල්මා තුෂාරි කොග්ගලගේ
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය.

## ABSTRAT

20 වන සියවසේ දෙවන අර්ධයේදී, දකුණු ආසියාතික ඉතිහාසඥයන් අතර, සමාජයීය ඉතිහාසය පිලිබඳ පර්යේෂණ සම්බන්ධයෙන් නව ප්‍රවණතාවක් දැකිය හැකි විය. එනම්, සමාජයේ විකාශය හා වෙනස්වීම් සම්බන්ධ අධ්‍යයනවලදී කාන්තාව පිලිබඳව විශේෂ කාන්තාවන්ගේ දායකත්වය පිලිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමයි. ආගම, සංස්කෘතිය, අධ්‍යාපනය ආදී විවිධ අංශවල කාන්තාවන්ගේ දායකත්වය පිලිබඳව මෙන්ම කානතාවට සමාජයේ ලැබුණු ස්ථානය පිලිබඳවත් අධ්‍යයනය කිරීමට පර්යේෂකයන් යොමු වූ බව පෙනේ. විශේෂයෙන්ම දකුණු ආසියාව තුළ මෙම ප්‍රවණතාව හටගත්තේ ඉන්දීය ඉතිහාසඥයන්ගේ ප්‍රමුඛත්වයෙනි.

ශ්‍රී ලංකාවේ, මහාචාර්ය සිරිමා කිරිබමුණේ (1990,2003), මාහාචාර්ය තිලකා මෙත්තානන්ද (1990,1995), මහාචාර්ය ඉන්ද්‍රාණී මුණසිංහ (1999) සහ මාහාචාර්ය නීරා වික්‍රමසිංහ (2003) වැනි පර්යේෂකයෝ මෙම අධ්‍යයන ක්ෂේත්‍රයෙහි නිරත වූවෝ වෙති.

ශ්‍රී ලංකාවේ පමණක් නොව සමස්ත දකුණු ආසියාකරයේ ම 1950 න් පසු මුල් දශක කීපය තුළ ,කාන්තාව මුල් කර ගෙන කරන ලද ඉතිහාස අධ්‍යයනයන්හි කැපී පෙනෙන ලක්ෂණය වූයේ, ඒවායේ පැවති විස්තරාත්මක (descriptive) සවභාවයයි. බොහොවිට මෙබඳුඅධ්‍යයනවල අවසාන නිගමනය කානතාව හිමි කරගෙන තිබූ ස්ථානය යහපත් හො අයහපත් එතත් වශයෙන් ඇගයීම(value judgment) කෙරෙහි යොමු වූ බව දැකිය හැකි විය. මේ ප්‍රවණතාව 1980 දශකය මුල් භාගය වන තුරු වඩාත් පැහැදිලිව දක්නට ලැබේ. එහි දී සැම විටම කානතාවගේ ස්ථානය (position) පුරුෂයාට සාපේක්ෂව ඇගැයීමකට ලක් කෙරිණි.

1980 දශකයේ දෙවන භාගය වන විට, මේ ප්‍රවණතාව වෙනස් විය. ඒ සමගම, දකුණු ආසියාතික සමාජයේ පවුල හා දේෂපාලනය තුළ පැවති පුරුෂ මූල පසුබිම කාන්තාව කෙරෙහි බලපෑ ආකාරය කෙරෙහි ඉතිහාසඥයන්ගේ අවධානය යොමු විය. ජාතික ව්‍යාපාර තුළ හෝ දේශපාලන වශයෙන් කේවල් කිරීමේ කණ්ඩායම් වල ස්වරූපයෙන් හෝ කාන්තාවගේ දායකත්වය අධ්‍යයනයට ලක් වූයේ මේ වෙනස හේතවෙනි.

1990 වන විට මේ තත්වය තවදුරටත් වෙනස් වූ බව පෙනේ. එහිදී ඉතිහාස අධ්‍යයනයක් තුළ ඇ තව දුරටත් සමාජ ක්‍රමයේ උපහටයෙකු(victim) වශයෙන් අර්ත දැක්වීමේ ප්‍රවණතාව වෙනස් වන්නට විය. මෙතැන් පටන්, සමාජයේ දේශපාලන හා සංස්කෘතික ක්‍රමය කෙරෙහි සාධනීය හෝ නිශේධනීය බලපෑමක් එල්ල කල හැකි බලකාරකයා(agents with power) වශයෙන් කාන්තාව සැලකෙන්නට විය. 1990 දශකයේ, ලාංකීය ඉතිහාස පර්යේෂණ තුළ ද මේ දෘෂ්ඨිය අනුව කාන්තාව කෙරෙහි අවධානය යොමු කරනු දක්නට ලැබේ.

මෙම අධ්‍යයනය, එම ප්‍රවණතාව සැලකිල්ලට ගනිමින් ඉතිහාස අධ්‍යයන ක්ෂේත්‍රයෙහිලා කාන්තාව අධ්‍යයනය(Women's Study) භාවිත කල හැකි නව දිශානතියක් කෙරෙහි අවධානය යොමු කරනු ලැබ ඇත. එනම්, මෙහි දී පරීක්ෂා කරනු ලබන්නේ, ඉතිහාස සම්බන්ධ අධ්‍යයනයකදී සමාජ වෙනස් වීම් ගවේෂණය කිරීම සඳහා කාන්තාවගේ තත්වය(Women's States) යන්න දර්ශකයක් වශයෙන් යොදා ගැනීමට ඇති හැකියාව පිලිබඳවයි.

මේ වනවිටත් සමාජ විද්‍යාව හා ආර්ථික විද්‍යව වැනි විෂයයන් තුළ මේ ආකාරයට කාන්තාවගේ තත්වය යන්න පර්යේෂණ සඳහා භාවිත කරනු ලැබේ.

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව නම්, කිසියම් සමාජ ක්‍රමයට විකාශනය හා පරිවර්තනය සම්බන්ධයෙන් කෙරෙන ඉතිහාස අධ්‍යයනයකදී කාන්තාවගේ තත්වය දර්ශකයක් වශයෙන් යොදා ගත හැකිද යන්නයි.

මෙහිදී, පර්යේෂකයා උපකල්පනය කරනු ලබන්නේ, විශේෂයෙන්ම පූර්ව-නුතන සමාජයක් පිලිබඳ එබඳු අධ්‍යයනයකදී කාන්තාවගේ තත්වය යන්න ප්‍රශස්ත මට්ටමේ දර්ශකයක් වශයෙන් භාවිත කල හැකි බවයි.